අප්‍රේල් 2021

Oceanswell
Oceans for all, forever

# කෝවිඩ්-19 හුදකලා කිරීම් මඟින් ශ්‍රී ලාංකීය වෙරළබඩ ධීවර කර්මාන්තයට ඇතිවූ බලපෑම

නාඩියා අස්මි, අර්පනා ගිරිතරන්, හෆ්සා ජමෙල්, සන්ගීතා මන්ගුභායි Ph.D., ආශා ඩි වොස් Ph.D.

සිංහල සාරාංශය - විරාන් වීරරත්න
Oceanswell, 9 පාර්ක් ගාඩ්න්ස්, කොළඹ 00500, ශ්‍රී ලංකාව

පහත දැක්වෙන්නේ කෝවිඩ්-19 වසංගතය නිසා පැනවූ ඇඳිරිනීති හා හුදකලා කිරීම් හමුවේ 2020 වසරේ අගෝස්තු මාසයට පෙර ශ්‍රී ලංකාවේ වෙරළබඩ ධීවර කර්මාන්තයට එල්ලවූ බලපෑම විශ්ලේෂණය කර සැකසුණු සවිස්තරාත්මක වාර්තාවෙහි සිංහල සාරාංශයයි.

සම්පූර්ණ වාර්තාව සඳහා - [https://oceanswell.org/publications/the-impacts-of-covid-19-lockdowns-on-coastal-fisheries-in-sri-lanka](https://oceanswell.org/publications/the-impacts-of-covid-19-lockdowns-on-coastal-fisheries-in-sri-lanka)

චිරාන් වීරරත්න

- ලෝකය පුරා කෝවිඩ්-19 ආසාදිතයින් සංඛ්‍යාව ක්ෂණිකව ඉහළ යෑම නිසා ශ්‍රී ලංකා රජය විසින් 2020 මාර්තු 20 වැනිදා මුළු දිවයිනටම පොලිස් ඇඳිරිනීතිය ඇතුළු සංවරණ සීමා පනවනු ලැබුවා. මෙම සංවරණ සීමා හා ඇඳිරිනීති මඟින් දිවයින පුරා වෙසෙන ධීවර ප්‍රජාවට ඇතිවූ බලපෑම විශ්ලේෂණය කිරීම අරමුණු කරගනිමින් Oceanswell සංවිධානය මඟින් මෙම අධ්‍යනය සිදු කරනු ලැබුවා.

- 2020 වසරේ ජූලි 29දා සිට අගෝස්තු 29 දක්වා ශ්‍රී ලංකා වෙරළ තීරයේ තෝරාගත් ස්ථාන 13ක සමීක්ෂණයන් භාරසිය පහළොවක් සිදු කරනු ලැබුවා. මේ දින වනවිට රජය විසින් කෝවිඩ්-19 සමාජ ව්‍යාප්තියක් සිදුවී තිබෙන බවට කිසිදු සඳහනක් කර නොතිබුණු අතර අධ්‍යනයට පෙර ධීවර ප්‍රජාවට කෝවිඩ්-19 මඟින් ඇතිවූ බලපෑම් බවට හඳුනාගෙන තිබුණේ දිවයින පුරා ඇඳිරිනීතිය, ප්‍රදේශ අතර ගමනාගමනය අවහිර වීම හා වෙළෙඳ කටයුතු සඳහා පනවා තිබූ නියාමනයන්ය.

- සියලූ සමීක්ෂණයන් අතුරෙන් 25%ක් කාන්තාවන්ගේ වන අතර එයින් සැලකියයුතු පිරිසක් ධීවර ක්ශේත්‍රය තුළ සැකසුම්කරුවන් ලෙසින් සේවය කරනු ලබනවා.

- මෙම අධ්‍යනය සඳහා ධීවරයින්, වෙළඳුන් හා සැකසුම්කරුවන් සහභාගි කරගෙන ඇති අතර ඔවුන් සියලු දෙනාම කෝවිඩ්-19 හේතුවෙන් පනවනු ලැබූ තහංචි ඔවුන්ගේ ධීවර ක්ශේත්‍රය හා සම්බන්ධ කටයුතු වෙත ඍණාත්මකව බලපා තිබෙන බව ප්‍රකාශ කර තිබේ. ධීවරයින්ට එම කටයුතු සඳහා මුහුදු යෑමට නොහැකි වීම නිසා සමස්ත ධීවර අගය දාමයටම බාධා ඇති වී තිබේ. සමීක්ෂණයට සහභාගි වූ පිරිසෙන් 84%කගේ අදායම පහත වැටී තිබෙන අතර ඒ සඳහා හේතු ලෙසින් ධීවර කටයුතු සිදුකර ගැනීමට තිබෙන බාධා, පාරිභෝගික අවශ්‍යතා පහත වැටීම හා අපනයන කටයුතු සීඝ්‍රයෙන් පහත වැටීම වැනි කරුණු පෙන්වා දිය හැකියි.

- සංසන්දනාත්මකව බලන විට සංචරණ සීමා ඇතුළු තහංචි තම කටයුතු සඳහා සෘණාත්මකව බලපා ඇති බව පවසන්නේ සැකසුම්කරුවන්ගෙන් සුළු පිරිසකි. එයට හේතුව විය හැක්කේ සැකසුම් නිශ්පාදන කල්තබා ගැනීමේ හැකියාව වැඩි නිසා ඔවුනට මෙවැනි වෙළෙඳපොළ හදිසි විචල්‍යතාවයන් හමුවේ තම නිශ්පාදන පාලනය කිරීමට ඇති හැකියාවයි.

- මුහුදු ආහාර මිළ ගණන් වෙනස්වීමේ විශේෂ ප්‍රවණතාවක් නොමැති නමුත් ගැඹුරු මුහුදේ කර්මාන්තයෙහි යෙදෙන ධීවරයින් විශාල ප්‍රමාණයක් මුහුදු ආහාර වල මිළ පහත වැටී තිබෙන බව ප්‍රකාශ කර තිබෙනවා. එයට හේතුන් ලෙසින් දැක්විය හැක්කේ ඔවුන් අල්ලා ගන්නේ වටිනාකමින් ඉහළ මුහුදු ආහාර වන අතර එයට වෙළෙඳ කටයුතු සඳහා පනවා තිබෙන නියාමනයන්, අපනයන කටයුතු අඩාල වීම් හා පාරිභෝගිකයන්ගේ මිළදී ගැනීමේ බලය අඩුවීම් වැනි කරුණු බලපෑම් කර ඇත.

- ධීවර ප්‍රජාව විසින් තම ආදායම පහත වැටීමට ප්‍රතිචාර ලෙසින් වඩාත් සුලබව භාවිතා කර තිබුණේ ඉතුරුම් මුදල් භාවිතයට ගැනීම හා ණය පහසුකම් ලබා ගැනීම වැනි උපාය මාර්ගයි. මීට අමතරව සුළු පිරිසක් රජය විසින් ලබාදුන් දීමනාවෙන් පමණක් යැපී තිබෙන අතර සමීක්ෂණයට සහභාගි වූවන් මූල්‍යාධාර හා අඩු පොළී ණය සේවා වැනි ඔවුනට වඩාත් ගැලපෙන මූල්‍යමය සේවාවන් ඉල්ලා තිබෙනවා.

- සමස්තයක් ලෙස ගත් විට මෙම අධ්‍යනය මඟින් සාගරය වෙත ප්‍රවේශ වීමට නොහැකිවීම, එම නිසා ධීවර කටයුතු හි නිරත වීමට හැකියාව නොලැබීමෙන් කුඩා ධීවර ප්‍රජාව වෙත සෘණාත්මක බලපෑමක් එල්ල වී තිබෙන්නේ ඔවුනට ඊට මුහුණදීමට ඉතා සීමිත උපාය මාර්ග ප්‍රමාණයක් පැවතීම හා ඔවුන් සතුව අමතර ආදායම් මාර්ග නොමැති වීම බව සොයාගෙන ඇත.

- මෙම අධ්‍යනයේ ප්‍රතිඵල, අනාගතයේදී ධීවර අගය දාමයන්ට බාධා වන, මුහුදු ආහාර ලබාගැනීමට අපහසු වන ආකාරයේ බිඳවැටීම් කල්තබා හඳුනාගැනීමට හා ඒවාට සූදානම් වීම සඳහා ආදර්ශකයක් ලෙසින් භාවිතා කල හැකිය. අනාගතයේදී එවැනි බිඳවැටීම් ඇති වීමට හේතු ලෙසින් ප්‍රමාණය ඉක්මවා මසුන් ඇල්ලීම, දේශගුණික විපර්යාස හා එමඟින් ඇතිවන බලපෑම් වන කුණාටු, මුහුදු මට්ටම ඉහළ යෑම හා වෙරළබඩ ප්‍රදේශ ජලයෙන් යටවීම වැනි දෑ දැක්විය හැකිය. මෙහි ප්‍රතිඵලයක් ලෙස සාම්ප්‍රදායික මසුන් ඇල්ලීමේ ස්ථාන ඵලදායි නොවීම, සාම්ප්‍රදායික ආම්පන්න හා ක්‍රම ඵලදායි නොවීම වැනි දෑ සිදු විය හැකියි. ප්‍රමාණයෙන් විශාල යාත්‍රා, ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීම හා නවීන තාක්ෂණයෙන් යුත් ධීවර ආම්පන්න භාවිතා කිරීම වැනි දෑ ධීවර කර්මාන්තයෙහි

අනාගතය සාර්ථක කර ගැනීමට විසඳුමක් ලෙසින් භාවිතා කිරීමට හැකි වුවත්, මෙම අනුගතවීමේ උපාය මාර්ග දිනෙන් දින අවදානමකට ලක්වන කුඩා පරිමාණ ධීවරයන්ට තවත් අභියෝගාත්මක වේ.

- මෙම බලපෑම් දැනට පවතින ව්‍යුහාත්මක, සමාජයීය හා ආර්ථික අසමතුලිතතා සමඟ සංයෝජනය වූ විට කෝවිඩ්-19 හා ඒ හා සමාන කම්පනයන් විසින් කුඩා පරිමාණ ධීවර ප්‍රජාවන්ගේ සෞඛ්‍ය හා සමාජ ආර්ථික තත්වයන් වෙත ඇතිවන බලපෑම තීව්‍ර වේ.

**ස්තූතිය**

මෙම ව්‍යාපෘතිය සඳහා මුදල් ලබාදීම වෙනුවෙන් ණෞව් Eන්ග්ලන්ඩ් ඇක්‍වුඅරිඋම් හි සමුද්‍ර සංරක්ෂණ ක්‍රියා අරමුදල වෙනුවෙන් අපගේ හදපිරි ස්තූතිය පිරිනමනු ලබනවා. මෙම සමීක්ෂණයට සහභාගි වූ සියලු දෙනාටම ඔවුන්ගේ සහයෝගයට හා දායකත්වයට ස්තූතිය පිරිනමන අතර ජෙගතීස්වරී එහම්පරම් ගුණසිංහම් මහත්මියට උතුරු හා නැගෙනහිර ප්‍රදේශ වල කටයුතු කළ අපගේ පර්යේෂණ සහකරුවන් හා සම්බන්ධ වීම සහ සමීක්ෂණයන් හි තත්ව පරීක්ෂාව සිදු කිරීම සම්බන්ධයෙන් විශේෂ ස්තූතියක් පිරිනමනු ලබනවා. ඊට අමතරව සියලුම සම්මුඛ පරීක්ෂණයන් මෙහෙය වූ අපගේ පර්යේෂණ සහකරුවන් වන කෞශලායයා බාලසූරිය, දිලිනි ගමගේ, මනූජ හෙන්දෙවිතාරන, ඉෆ්ලාල් ඉලියාස්, තමිලිනි කනේශාලින්ගම්, මොහොමඩ් මූජාස්, කජන්තිනි රජනලෙන්ද්‍රන්, ශලංක රන්ජුල, රිෆ්ධා රිස්වාන්, ඇන්ටනි සන්තෝශ්, සරන්‍යා සින්නතුරෙයි, සතියවකීස්පරන් සිවනාදන්, අබිලාගිනි වික්‍රමන් සහ මුතුලින්ගම් යුහින්තන් වෙත අපගේ ස්තූතිය පුද කරනවා. ව්‍යාපෘතිය සැකසීම සඳහා දායක වූ ඊශා සහ නදුනි මල්ලිකා ආරච්චි වෙත අපගේ ස්තූතිය හිමිවනවා. මෙම ව්‍යාපෘතිය සඳහා දත්ත විශ්ලේෂණයෙන් දායක වූ ආචාර්ය නෙලී කාඩාගි මහත්මිය වෙත ඇයගේ සහයෝගය සඳහා අපගේ විශේෂ ස්තූතිය හිමිවනවා.

**References**

1. Foreign Ministry - Sri Lanka. (2020, March 20). Declaration of police curfew island wide [Press release]. Retrieved from https://mfa.gov.lk/declaration-of-police-curfew-island-wide/
2. National Aquatic Resources Research and Development Agency (NARA). (2019). Fisheries Industry Outlook- 2018 (7-24). http://www.nara.ac.lk/wp-content/uploads/2017/09/fisheries-industry-outlook-2018-converted-Copy.pdf
3. Edirisinghe, K., Wansapala, J., & Wickramasinghe, I. (2018). Review of marine fishery status along the supply chain in Sri Lanka. International Journal Of Food Science And Nutrition, 3(4), 10-23.
4. Arulananthan, K. (2017). Proceedings of the Workshop on Present Status of Research Activities on Climate Change Adaptations. Proceedings of the Workshop on Present Status of Research Activities on Climate Change Adaptations (Ed. B. Marambe), 121-126.
5. Bennett, N. J., Finkbeiner, E. M., Ban, N. C., Belhabib, D., Jupiter, S. D., Kittinger, J. N., Mangubhai, S., Scholtens, J., Gill, D., & Christie, P. (2020). The COVID-19 Pandemic, Small-Scale Fisheries and Coastal Fishing Communities. *Coastal Management, 48* (4): 336-347, doi: 10.1080/08920753.2020.1766937

Oceanswell
Oceans for all, forever